**සූරියවැව ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**-------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**-------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජුනි 28 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-----------------------------**

මෙම වාර්තාවේ **1.3** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට සූරියවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**---------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**----------------------**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) මහගල්වැව සතිපොල භූමිය පවරා ගැනීම වෙනුවෙන් මිනින්දෝරු අධිකාරියට ගෙවිය යුතු රු. 57,500 ක මුදල සඳහා ණයහිමි ප්‍රතිපාදන ඇති කර නොතිබුණි.

(ආ) නගර ශාලාව සඳහා මිලදී ගෙන තිබූ රු. 36,500 ක් වටිනා මයික් සිටුවනය ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සභාවේ ගබඩාව සඳහා මිලදී ගෙන තිබූ රු. 18,000 ක් වූ ඇලුමිනියම් දොරෙහි වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 102,773 ක වටිනාකමින් යුත් පාරිභෝගික භාණ්ඩ තොගයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) අලිඔළුආර පොල භූමියේ තිබෙන වැසිකිලිය සංවර්ධනය කර අලුත්වැඩියා කිරීම වෙනුවෙන් 2016 වර්ෂයේදී ගෙවා තිබූ රු. 88,732 ක පුනරාවර්තන වියදම සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**1.3.2 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්**

(අ) ලැබිය යුතු ගිණුම්

i. 2016 වර්ෂයේදී ඉටු කර තිබූ කර්මාන්ත හතකට අදාළව ලැබිය යුතු එකතුව රු. 969,024 ක් වූ සියයට දහයේ රැඳවුම් මුදල් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අය කර ගෙන නොතිබුණි.

ii. සමාලෝචිත වර්ෂය අවසානයට ජල පාරිභෝගිකයින් 237 දෙනෙකුගෙන් රු. 244,288 ක ජල බිල්පත් ගාස්තු අය විය යුතුව තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

i. සමාලෝචිත වර්ෂය අවසානයට රු. 12,567,971 ක් වූ විවිධ, කර්මාන්ත සහ ජල සැපයුම් ණයහිමි ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

ii. සභාවේ දැනට සේවයේ නොමැති සේවකයින් 22 දෙනෙකු වෙත ගෙවිය යුතු රු. 152,174 ක වටිනාකමින් යුතු සේවක ඇප ශේෂ නිරවුල් කර නොතිබුණි.

iii. 2017 දෙසැම්බර් 31 දිනට දේපළ ණය වෙනුවෙන් රු. 5,278 ක පොලී මුදලක් ගෙවිය යුතුව තිබුණි.

**1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 11,690,681 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (අ) 134 (1) වගන්තිය | නව වරිපනම් බදු තක්සේරු කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිමවී නොතිබුණි. |
| (ආ) 152(2) වගන්තිය | සභා බල ප්‍රදේශය තුළ පරිචයේ යෙදෙන වෘත්තිකයන්ගෙන් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

**-------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,072,724 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,657,170 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i වරිපනම් හා බදු | 1,115,000 | 813,030 | 810,180 | 18,100 | 7,820,000 | 963,400 | 924,350 | 39,050 |
| ii කුලී | 19,847,500 | 17,930,430 | 17,813,530 | 911,950 | 12,880,600 | 15,505,298 | 14,603,448 | 901,850 |
| iii බලපත්‍ර ගාස්තු | 1,164,200 | 1,058,871 | 1,031,671 | 27,200 | 1,585,830 | 787,784 | 694,084 | 93,700 |
| iv වෙනත් ආදායම් | 5,720,300 | 7,187,516 | 4,480,293 | 5,626,249 | 5,304,000 | 6,052,387 | 1,843,320 | 4,209,067 |
| එකතුව | 27,847,000 | 26,989,847 | 24,135,674 | 6,583,499 | 27,590,430 | 23,308,869 | 18,065,202 | 5,243,667 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

---

සමාලෝචිත වර්ෂයයේ බිල්කළ ආදායම රු. මිලියන 26.99 ක් වූ අතර, ඉන් රු. මිලියන 24.13 ක් රැස්කර තිබුණි. ඉකුත් වර්ෂය අවසානයට රු. මිලියන 5.24 ක් වූ හිඟ අදායම සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. මිලියන 6.58 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**2.2.3 කුලී**

----

කඩ කුලී

--------

(අ) 2017 දෙසැම්බර් 31 දිනට කඩ කාමර 40 කින් කුලී හා ප්‍රමාද ගාස්තු වශයෙන් එකතුව රු. 984,955 ක මුදලක් අයවීමට තිබූ අතර, එම හිඟ මුදල් අය කර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සූරියවැව බස් නැවතුම්පොළෙහි පිහිටි කඩ කාමර 09 කින් සහ සූරියවැව සතිපොළ අසල කඩ කාමර 10 කින් සමාලෝචිත වර්ෂයට අදාළව කිසිදු බදු මුදලක් අය කර ගෙන නොතිබූ අතර, 2017 දෙසැම්බර් 31 දිනට කඩ කුලී හා ප්‍රමාද ගාස්තු වශයෙන් එකතුව රු. 924,205 ක මුදලක් හිඟව තිබුණි.

(ඇ) 2010 දෙසැම්බර් 27 අංක දපපා/පපාකො/2010/01 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 04 ඡේදය අනුව එක්වන් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, 2017 දෙසැම්බර් 31 දිනට සූරියවැව සතිපොළ අසළ කඩ කාමර 09 කින් සහ බස් නැවතුම්පොළ අසල කඩ කාමරයකින් අයවිය යුතු එක්වන් මුදල් වල වටිනාකම රු. 382,592 ක් විය.

(ඈ) සූරියවැව සතිපොළ අසල කඩහිමියන් හත් දෙනෙකුගෙන් සහ සූරියවැව බස් නැවතුම්පොළ අසල කඩ හිමියෙකුගෙන් 2011 වර්ෂයට පෙර සිට අයවිය යුතු එක්වන් මුදල් වල වටිනාකම රු. 292,592 ක් විය. මෙසේ දීර්ඝ කාලයක් තුළ එක්වන් මුදල් නොගෙවා සිටියද මෙම කඩකාමර සභාවට නැවත පවරා ගැනීමට හෝ එම මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**2.2.4 ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු**

---

සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත හා ව්‍යාපාර ඒකක 19 කින් රු. 18,100 ක බදු මුදලක් අයවීමට තිබුණි.

**2.2.5 වෙනත් ආදායම්**

---

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලබන හෝටල් ආපනශාලා හා නවාතැන් වලින් පෙර වසරේ ආදායමින් සියයට 1 ක් නොඉක්මවන ගාස්තුවක් අයකරගත හැකි වුවද, සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යන එක් හෝටලයකින් 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා රු. 1,000 බැගින් වූ වාර්ෂික වෙළෙඳ බලපත්‍ර ගාස්තුවක් පමණක් අයකර ගෙන තිබුණි.

**2.2.6** උසාවි දඬ

----------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 5,314,361 ක් විය.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1** **කාර්යසාධනය**

----------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ සභාව විසින් ඉටු කළ යුතු මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

--------------------------------------

2017 වර්ෂයේ අයවැය ලේඛනය අනුව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වූ සංවර්ධන යෝජනා 57 න් සංවර්ධන යෝජනා 29 ක් පමණක් ඉටු කර තිබුණි.

(ආ) ආර්ථික ප්‍රතිලාභ ලබා නොගැනීම

---------------------------------------

සභාවේ කළමනාකරණ තොරතුරු පද්ධතිය සංවර්ධනය කර ගැනීම වෙනුවෙන් රු. 720,000 ක වටිනාකමින් යුත් පරිගණක යෙදවුම් මෘදුකාංග පද්ධති 04 ක් මිලදී ගැනීම සඳහා 2017 අප්‍රේල් 04 දින පුද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගතවී සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු. 540,000 ක මුදලක් ගෙවා තිබුණද, 2018 අප්‍රේල් 05 දින වන විටත් එම පරිගණක යෙදවුම් මෘදුකාංග පද්ධතිය සභාවේ කාර්යසාධනයට දායක කර ගෙන නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ භූමිය වටා ආරක්ෂිත වැටක් ඉදිකර නොතිබුණු අතර, සභාව විසින් විධිමත් කසළ කළමනාකරණයක් සිදු කර කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමේ කටයුතු 2018 අප්‍රේල් 05 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**3.2** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයෙකු බඳවා ගෙන තිබුණු අතර, තවත් තනතුරු 04 ක සේවකයින් 06 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.

(ආ) අනුමත සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනෙක් සහ වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් පස් දෙනෙක් ඇතුළත්ව නිලධාරීන් නව දෙනෙකුට ඔවුන්ට අයත් රාජකාරී නොපවරවා වෙනත් රාජකාරී පවරා තිබුණි.

(ඇ) සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 65,175 ක ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**---------------------------**

වීථි පහන් නඩත්තුව

--------------------

2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරන විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන වලට අනුකූලව, සභා බල ප්‍රදේශය තුළ ස්ථාපනය කර ඇති වීථි පහන් පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලය වෙත අයදුම් කර විධිමත් කර නොගැනීම නිසා සභා අරමුදලින් නඩත්තු කරන වීථි පහන් 1583 න් 531 ක් සඳහා පමණක් ගාස්තු ප්‍රතිපූර්ණය කර තිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**--------------------------**

**3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

**-------------------------------------------**

පැවරුම් නියෝග මගින් සූරියවැව ප්‍රාදේශීය සභාවට පවරාගෙන ඇති සමාජසේවාපුර II වීරියගම හා විහාරගල යන ස්ථාන වල ඇති සුසාන භූමි වටා වැටවල් ඉදිකර, භූමි වෙන්කර ගෙන නොතිබුණි.

**3.4.2 පවරා නොගත් වත්කම්**

**------------------------**

සභාව විසින් භාවිතා කරනු ලබන පිරිවැය රු. 38,225,000 ක් වූ ගොඩනැගිලි 11 ක, පිරිවැය රු. 18,500,000 ක් වූ ඉඩම් 07 ක සහ සුසාන භූමි 31 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට අදාළ කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිමවී නොතිබුණි.

**3.4.3 වාහන උපයෝජනය**

**----------------------**

2016 අගෝස්තු මාසයේ සිට ගර්භිත තත්ත්වයේ පවතින කැබ් රථයක් ධාවනය කිරීමට නුසුදුසු බැවින් අපහරණය කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.5 ප්‍රසම්පාදනය**

**---------------**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

**-----------------------**

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය**

**--------------------------**

සූරියවැව පොදු වෙළඳ පොළේ මාළු වෙළඳ පොළ ඉදිකිරීම

-----------------------------------------------------------------

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ සූරියවැව පොදු වෙළඳ පොළේ මාළු වෙළඳ පොළ ඉදිකිරීම් කටයුතු 2016 පෙබරවාරි මාසය වන විටත් අවසන් කර තිබූ නමුත්, මාළු වෙළඳ පොළ විවෘත කර ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රයෝජනය සඳහා ලබා දී නොතිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**-----------------------------------------**

**අයවැය පාලනය**

**-------------------**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

(අ) රු. 10,000 ඉක්මවූ වැය විෂයයන් 56 ක් සඳහා අයවැය ලේඛනය මගින් වෙන්කර තිබුණු එකතුව රු. 10,370,000 ක ප්‍රතිපාදන වලින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළ වැය කර නොතිබුණි.

(ආ) ආදායම් විෂයයන් තුනක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 25,315,802 ක් වූ අතර, එම වටිනාකම් සියයට 27 සිට 56 දක්වා පරාසයක විය.

(ඇ) වියදම් විෂයයන් හයක ඉතිරිකිරීම් වල එකතුව රු. 23,955,798 ක වූ අතර, එම වටිනාකම් සියයට 30 සිට 71 දක්වා පරාසයක විය.

**5. පද්ධති හා පාලන**

**-------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ගිණුම්කරණය | i. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගිණුම් ශේෂ අත්හැරී ඇති අවස්ථා පැවතීම. |
| | ii. අවිනිශ්චිත ගිණුම් නිවැරදිව නිරවුල් කර නොතිබීම. |
| (ආ) ආදායම් පරිපාලනය | i. නව වරිපනම් බදු තක්සේරු කර අයකර ගැනීමට කටයුතු කර නොතිබීම . |
| | ii. හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| | iii. නව ආදායම් උත්පාදන මාර්ග හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමුවී නොතිබීම. |

(ඈ) සේවක මණ්ඩල කළමනාකරණය

i. මාර්ග කම්කරුවන් හා සෞඛ්‍ය කම්කරුවන් ඔවුන්ට අයත් නොවන රාජකාරී වල යොදවා තිබීම.

ii. පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම හා අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබීම.

(ඈ) අයවැය පාලනය

i. ආදායම් හා වියදම් විෂයයන් වෙනුවෙන් අධි ඇස්තමේන්තු සිදුවී තිබීම.

ii. ඇතැම් වැය විෂයයන් වල ඇස්තමේන්තුගත සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබීම.

iii. අයවැයගත ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා කටයුතු සිදුකර නොතිබීම.